## ජෝර්ජස් බැන්ක් මුහුදු ප්‍රදේශය,
*1896*

ශීත සෘතුවේ මැද භාගයේ එක්තරා දිනෙක මැසචුසෙට්ස් වෙරළට ඔබ්බෙන් යාත්‍රා කරමින් තිබූ මැකරල් මසුන් දඩයමේ යෙදුනු කුඩා ස්නූකර් යාත්‍රාවක් විසින් සාගර මත්තෙ හි පාවෙමින් තිබියදී පණිවුඩයක් බහාලූ බෝතලයක් සොයාගෙන තිබුණි. ඒ මොහොතේ ස්කූනර් යාත්‍රාව ලොව වඩාත්ම භයානක මත්ස්‍ය දඩබිමක් ලෙස කුප්‍රකට ජෝර්ජස් බැන්ක් මුහුදු ප්‍රදේශයෙ හි යාත්‍රා කරමින් තිබූ අතර බෝතලයක බහාලන ලද පණිවුඩයක් වනාහි නිසැකයෙන් ම අතිශය භයංකාර සංඥාවක් වූයේ ය. නැවියෙකු විසින් අල්ලාගන්නා ලදුව පටලැවී තිබූ මුහුදු පැළෑටිවලින් නිදහස් කරගත් බෝතලය යාත්‍රාවේ කප්පිත්තා අතට පත් කෙරිණි. වසා තිබූ ඇබය කරකවා බෝතලය විවෘත කළ කප්පිත්තා, එ තුළ වූ ලියවිල්ල ඉවතට ගනිමින් රැස්ව හුන් සිය පිරිස දෙසට හැරුණේ ය.

*''ජෝර්ජස් බැන්ක් ප්‍රදේශය ට ඔබ්බෙන් මුහුදේ දී... කේබලය කැඩී ගොස්, සුක්කානම ද අහිමිව ඇත. නැව් බඳ සිදුරු වී ජලය කාන්දුවෙයි. මේ වනවිටත් මුහුදු රළට ගසාගෙන ගොස් දෙදෙනෙක් අතුරුදන් වී තිබේ. කේබලය ද සුක්කානම ද අහිමි ව සියළු බලාපොරොත්තු සුන්ව සිටිමු. කිසිවෙකු හට මේ පණිවුඩය හමුවේ නම් දැනගැනීම පිණිස මෙසේ ලියාතබමි. දෙවියන් වහන්සේගේ දයාව අප වෙත ලැබේවා!''*

එය, පසුගිය වසරට කලින් වසරේ ග්ලෝව්සෙස්ටර් වෙතින් දියත් කළ ෆැල්කන් නම් යාත්‍රාවක් විසින් තබන ලද පණිවුඩයක් විය. එදා පටන් මේ මොහොත වනතුරු ම ඇය පිළිබඳ වෙනත් කිසිදු තොරතුරක් අසන්නට ලැබී නොතිබිණ. ජෝර්ජස් බැන්ක් ආසන්න ප්‍රදේශයේ දී කේබලය කැඩී වෙන්වන යාත්‍රාවක් රළ පහරට හසු වීමෙන් අන්ත අසරණව ක්‍රම ක්‍රමයෙන් කොහේ හෝ නොගැඹුරු මුහුදු ප්‍රදේශයකට නිදැල්ලේ පාවීගොස් කෲර රළගෙඩිවල අකාරුණික හා අවිච්ඡින්න ප්‍රහාරයන් හමුවේ කුඩා කැබලිවලට බිඳීයාමෙන් අවසානයේ

UNEDITED SAMPLE PAGE

දී සිය ඉරණම විසඳා ගන්නීය. ඒ භයංකාර ව්‍යසනය මැද ඇණිය මත කොහේ හෝ තැනක මුක්කු ගසාගත් ෆැල්කන් හි නාවිකයෙකු විසින් නිවෙමින් දැල්වෙමින් ගැහෙමින් පණ අදිමින් තිබූ කුණාටු ලන්තෑරුමක එළියෙන් ඉමහත් කලබලයෙන් යුතුව මේ සටහන තබන්නට ඇත. ඒ වූ කලී අවසානය යි. යාත්‍රාවේ හුන් සියළුදෙනා ඒ බව දැන ඉන්නට ඇත. *ගිලෙමින් තිබෙන යාත්‍රාවක සිටිනා මිනිසුන් ක්‍රියාකරන්නේ කෙසේ විය හැකි ද? ඔවුන් එකිනෙකා අල්ලා වැළඳ ගන්නේ ද? විස්කි වඩියක් අතිනත යවමින් සව්දිය පුරන්නෝ ද? ඔවුහු හඬත් ද?*

මිනිසුන් විසිදෙනෙකු මෙලොව ගතකළ අවසාන නිමේෂයන් කිහිපය පිළිබඳ තතු, ඉවත දැමූ කඩදාසි කැබැල්ලක මෙසේ ලියා තබන බව ඒ මිනිසා සටහන්කර තිබුණි. අනතුරුව ඔහු සිය ලිපිය බෝතලයක් තුළ බහා ඇබගසා මුහුදට විසිකරන්නට ඇත. දිවි බේරාගන්නට කිසිදු අවස්ථාවක් තමන්ට නොලැබෙන බැව් ඔහු සිතන්නට ඇත. එක්බිති නැවතත් පහළ තට්ටුව කරා යන හෙතෙම ගැඹුරු හුස්මකින් සිය පෙනහළු පුරවාගෙන, මුහුද හා ගැටීමේ ප්‍රථම කම්පනය දරාගනු පිණිස සන්සුන්වන්නට උත්සාහ කරන්නට ඇත.

**මෙහි කේබලය යනුවෙන් හැඳින්වෙන්නේ මසුන් ඇල්ලීම සඳහා භාවිතා කරන බිලි කොකු ඇමිණූ කුඩා යොත් සවිකර කෙරෙන ප්‍රධාන යොත යි.*

UNEDITED SAMPLE PAGE

ග්ලෝච්සෙස්ටර්, මාස්.

*1991*

*ඔබ මිළට ගන්නේ මසුන් නොවේ,*
*ඒ මිනිසුන්ගේ ජීවිතයයි...*

- "The Antiquary" පළමුවැනි පරිච්ඡේදය, සර් වෝල්ටර් ස්කොට්

UNEDITED SAMPLE PAGE

ශරත් ඍතුවේ පොද වැස්ස ගහකොළ අතරින් රූරා ඇදහැලෙයි. මුහුදේ ලුණු රසය හා මිශ්‍ර වූ අවට වාතය කට කාරවන තරම් කටුකය. මත්ස්‍ය ලේ පැල්ලමින් විචිත්‍ර වූ කමිසවලින් සැරසීගත් මිනිසුන් සිය බෝට්ටු තට්ටු මත සිට එකිනෙකා අමතා මොරදෙන හඬ, අසළ වූ රොජර්ස් වීදියේ ගමන්කළ ට්‍රක්රථවල ගොරහැඩි නාදය හා මුසුව ඇසෙයි. බෝට්ටුවලට යටින් වූ මහ සයුර ලොකු කුඩා දියරැළි නගමින් විටෙක ජැටියේ කාලවර්ණ ආධාරක කණුවල මුදුන දක්වා උස්ව ද, තවත් විටෙක එහි පාදමට ඇලී හුන් බෙල්ලන් සහ කාවාටියන් දක්වා පහත්ව ද නැගෙමින් බසිමින් අනුවර්තීය චලනයක යෙදෙයි. දිය මත තැන තැන පාවෙමින් ඒ හා සමානව ඉහළ පහළ යන බීර කෑන් සහ පැරණි ස්ටයිරෆෝම් කැබලි ය. ජලතලය මතුපිට තැන් තැන් හි එක්රැස් ව තිබූ ඩීසල් ඉන්ධන පැල්ලම් දේදුණු පැහැ දැවැන්ත ජල්ලි මත්ස්‍යයින් මෙන් දියරැළි මත තරංගාකාරව රඟදෙනු පෙනෙයි. රැල්ලත් සමඟ ඒ මේ අත පැද්දෙන බෝට්ටුවල කිරි කිරි හඬ නඟන කඹ මත්තෙහි වසා අවලාද නඟමින් හුන් මුහුදු ලිහිණියෝ තව තවත් උස් හඬින් කෑ මොරදෙමින් වඩා ආරක්ෂාකාරී ඉරියව්වවලට සීරුමාරු වෙති. රොජර්ස් වීදියෙන් අනෙක් පැත්තෙහි වූ ක්‍රෝස් නෙස්ට් හෙවත් 'කපුටු කූඩුව' අවන්හලේ පිටුපස දොරෙන් ඇතුළු වී සිමෙන්ති පඩිපෙළ දිගේ ඉහළට නැග, බුමුතුරුණු ඇතිරූ පටු ආලින්දය ඔස්සේ ඉදිරියට යන කළ එහි වම්පසට වන්නට පිහිටා ඇති අංක විසිහත දරණ කාමරයෙ හි වූ යුගල යහනක් මත පොරෝනාවක දැවටී සිටි බොබී ෂැට්ෆෝර්ඩ් නින්දක ගැලී හුන්නේ ය.

ඔහුගේ එක් ඇසක් ඉදිමී නිල්පැහැ වී තිබුණි. බීර කෑන් සහ ආහාර ඔතා තිබූ කොළ විසිරුණු කාමර බිමෙහි එක් තැනෙක වූ අඩක් අවුස්සා ඇද දමා තිබූ විවෘත ගමන් මල්ලක, කමිස කිහිපයක් සහ නිල්පැහැ ජීන්ස් කලිසම් කිහිපයක් පෙනෙයි. ඔහු අසළම, යහනේ අනෙක්පස, ඔහුගේ පෙම්වතිය වූ ක්‍රිස්ටිනා කොටර් නිදා සිටියා ය. මළකඩ පැහැයට හුරු තඹ වර්ණ කෙස් කළඹකට උරුමකම් කී ක්‍රිස්ටිනා ශක්තිමත්, නොපළල් මුහුණකින් යුතු වූ වයස හතළිස් ගණන්වල මුල්භාගයේ හුන් ළගන්නා සුළු පෙනුමකින් යුතු ගැහැනියක වූවා ය. කාමරය තුළ රූපවාහිණී යන්ත්‍රයක්, ලාච්චු සහිත තූස් කණ්නාඩි මේසයක් සහ උසස් පාසැල් ආපනශාලාවන් හි දක්නට ලැබෙන ආකාරයේ පුටුවක් වූ අතර එහි ප්ලාස්ටික් කුෂන් කවරය පුරා දුම්වැටි නිසා ඇතිවුණු පිළිස්සුම් සළකුණු සටහන් ව තිබුණි. ජනේලයට එපිටින් දර්ශණය වූයේ මත්ස්‍ය සැකසුම් කර්මාන්තශාලා දක්වා දිවෙන, ට්‍රක් රථ වලින් පිරී ගත් රොජර්ස් වීදියයි.

වර්ෂාව නොනැවතී ඇද හැලෙයි. වීදියට එපිටින්, මාළු බෝට්ටු ඉන්ධන ලබාගැනීම සඳහා භාවිතා කරන රෝස් මැරීන් ජැටිය ද, ඊට ඔබ්බෙන් වූ පටු ජල තීරයක අනෙක් පැත්තෙ හි මුහුදු ගොස් ආපිට එන බෝට්ටු සිය මත්ස්‍ය අස්වැන්න ගොඩබෑම සඳහා යොදාගන්නා ආණ්ඩුවේ ජැටිය ද පෙනෙයි. කණු මත ගොඩනැගුණු අතිවිශාල වාහන නැවතුම් පොළක් වන ආණ්ඩුවේ ජැටියට ඔබ්බෙන් වූ කලින් ආකාරයේ ම තවත් පටු ජලතීරයකට එපිටින් තවත් බෝට්ටු නැවතුම්පොළක් ද මව්වරුන් විසින් නිතර දෙවේලේ සිය කුඩා දරුවන් ක්‍රීඩා කිරීම සඳහා කැටුව ආ කුඩා උද්‍යානයක් ද විය. උද්‍යානයට ඉහළින් බැලූ කළ හස්කෙල් වීදියේ කෙළවර පිහිටා තිබූ, සුප්‍රසිද්ධ බොස්ටන් ගෘහ නිර්මාණකරුවෙකු වූ චාර්ල්ස් බල්ෆින්ච් විසින් ගොඩනඟන ලද කදිම ගඩොල් ගොඩනැගිල්ලක් දැකගත හැක. එය කලින් බොස්ටනයේ වොෂින්ටන් සහ සමර් වීදී මංසන්ධියෙ හි පිහිටා තිබූ අතර පසුව වසර 1850දී මුළුමනින්ම ඔසවා බත්තලයක පටවා ගෙනවුත් ග්ලෝචිසෙස්ටර් හි ස්ථාපනය කරන ලද්දකි. ඒ වූ කලී බොබීගේ මව එතෙල්, සිය පුතුන් සිව්දෙනා සහ දියණියන් දෙදෙනා උස්මහත් කළ ස්ථානය විය. පසුගිය වසර දහ හතරක් තිස්සේ ඇය 'කපුටු කූඩුව' හෙවත් ක්‍රෝස් නෙස්ට් තැබෑරුමෙහි දිවා කල සේවයේ නිරතව සිටින්නී ය. එතෙල්ගේ මුත්තා ද ධීවරයෙකු වූයේ ය. ඇගේ දියණියන් දෙදෙනා ද ධීවරයන් සමඟින් පෙමින් බැඳුණු අතර පුතුන් සිව්දෙනා ද විටෙන් විට මසුන් ඇල්ලීමෙහි නිරත වූ හ.

නැගෙනහිර දිශාවට මුහුණලා තිබූ කපුටු කූඩුවෙහි

UNEDITED SAMPLE PAGE

ජනේල, පාන්දර ජාමයේ දී භාණ්ඩ ප්‍රවාහන අධිශීතකරණ ට්‍රක්රථ විසින් අරක් ගන්නා වීදියට ඉහළින්, උදාවන දිනය දෙස බලා හිඳී. නේවාසික අමුත්තෝ සාමාන්‍යයෙන් දහවල් වෙනතුරු නිදාගැනීමට නොපෙළෙඹෙති. උදෑසන අට පමණ වනවිට බොබී ෂැට්ෆෝර්ඩ් අවදි වීමට උත්සහ කළේය. හැඩපළු ගැසුණු කෙස් කළඹකට සහ ගිළුණු කම්මුල් යුගලකට හිමිකම් කී ඔහුගේ නහරවැල් ඉලිප්පී ගිය ශක්තිමත් ශරීරය, බොහෝ වෙහෙස වී වැඩ කරන්නෙකුගේ ලක්ෂණ මනාව කියාපෑවේ ය. තවත් පැය කිහිපයකින් හේ පුරා මාසයක තලපත් මසුන් දඩයම් චාරිකාවක් සඳහා ග්‍රෑන්ඩ් බෑන්ක්ස් මුහුදු ප්‍රදේශය කරා යාමට සූදානම්ව තිබූ *ඇන්ඩ්‍රියා ගේල්* නම් යාත්‍රාව සමග පිටත්වීමට නියමිතව සිටියි. සියල්ල හොඳින් සිදුවුවහොත් ඩොලර් පන්දහසකින් ඔහු සිය සාක්කු පුරවාගෙන නැවත එනු ඇත. එක් අතකට ඔහු යළි කිසි දිනෙක නොපැමිණීමට ද ඉඩ තිබේ. වර්ෂාව තවමත් නොනැවතී ඇද හැලෙයි. ක්‍රිස්ටිනා කොටර් කෙඳිරිළි හඬක් නවමින් දෑස් හැරියා ය. අඩවන් දෑසින් බොබී දෙස බැලූ ඇය, පමණට වඩා ඉදුණු ප්ලම් ගෙඩියක පැහැය ගත් ඔහුගේ තැළුණු ඇස දුටුවා ය.

"මේ මගේ වැඩක්?"

"හ්ම්ම්..."

"ජේසුනේ...!"

ඇය තවත් මොහොතක් ඔහුගේ ඇස දෙස බලා සිටියා ය.

"මෙච්චර උසකට කොහොම ගැහුව ද මං...?"

හවුලේ දුම්වැටියක් උරා අවසන් කළ දෙදෙනා ඇඳුම් සකස් කරගැනීමෙන් අනතුරුව පහත මාලයට ආ හ. යකඩින් තැනූ ගිනි ආරක්ෂණ දොරකින් පිටව පටු වීදියකට බට ඔවුහු ක්‍රෝස් නෙස්ට් හි රොජර්ස් වීදියට විවෘත වූ ද්වාරය කරා ඇවිද ගිය හ. අතුරු මාර්ග දෙකක් අතර සම්පූර්ණ ඉඩ ප්‍රමාණයම අරක් ගැනීමට තරම් විශාල ව, ජේ. බී. රයිට් මත්ස්‍ය සමාගමේ ගොඩනැගිල්ලට සහ රෝස් මැරීන් ජැටියට ප්‍රධාන මාර්ගයේ විරුද්ධ පැත්තෙ හි පිහිටා තිබූ කපුටු කූඩුව ටියුඩර් ගෘහ නිර්මාණ කලාව අනුකරණය කරමින් අඩක් දැවයෙන් තනා තිබූ ගොඩනැගිල්ලක් වූයේ ය. එහි ඉදිරිපස වූ උස් වීදුරු ජනේල, නගරයේ තැබෑරුමක තිබුණු විශාලතම ඒවා විය. සමහර සේවාලාභී පාරිභෝගික භවතුන් වෙනත් පාරිභෝගික භවතුන් විසින් එළියට විසිකර දමනු ලැබීම වළක්වනු පිණිස කුඩාවට තැනූ තැබෑරුම් ජනේල සහිත නගරයක ඒ වූ කලී සෑහෙන වෙනස්කමක් වූයේ ය. පූල් ක්‍රීඩාව සඳහා යොදාගන්නා පැරණි මේසයට සහ දොර අසළ සවිකර තිබූ කාසි කවා

UNEDITED SAMPLE PAGE

ගැනීමට මර්ෆ් හට අවශ්‍යවූයෙන් ක්‍රිස්ටිනා ඔවුන් ගුඩ් හාබර් වෙරළ අසළ වූ වෙළඳ සංකීර්ණයක් වෙත රැගෙන ආවා ය. බොබී සහ බග්සි ගමනට අවශ්‍ය අඩුවැඩිය කිහිපයක් මිළට ගන්නා අතරතුර මර්ෆි රාක්ක පීරමින් සිය ට්‍රොලිය ටොන්කා ට්‍රක්රථ, ගිණි නිවන භටයින් පළඳිනා ආකාරයේ හිස්වැසුම් සහ කිරණ තුවක්කු ආදියෙන් පුරවන්නට පටන් ගත්තේ ය. අත්කරත්තයේ තවත් ඉඩ නැති වූ කල් හි මිළට ගත් සියල්ල වොල්වෝ රථයේ පටවාගත් ඔවුහු නැවතත් කපුටු කූඩුව බලා ගියහ. බේල් මර්ෆි එහි දී රථයෙන් බැසගත් අතර ඉතිරි තිදෙනා තවත් බීම වටයක් වෙනුවෙන් අසළ වූ ග්‍රීන් ටැවර්න් තැබෑරුම බලා පිටත් වූහ.

ගඩොලින් සහ කෘතිම දැවයෙන් තනා තිබූ ග්‍රීන් ටැවර්න් තැබෑරුම කපුටු කූඩුවෙහි ම කුඩා ප්‍රමාණයේ අනුරුවක් බඳු විය. මාර්ගයෙන් අනෙක් පැත්තෙහි වූ බිල්ගේ තැබෑරුම ද සැළකූ කළ මෙම තැබෑරුම් තුන එක්ව ග්ලෝච්සෙස්ටර් වෙළඳ නගරයේ බර්මියුඩා ත්‍රිකෝණය නිර්මාණය කෙරුණි. ක්‍රිස්ටිනා, බොබී සහ බග්සි තිදෙනා බීර වටයක් ඇණවුම් කරමින් හිඳගත්හ. රූපවාහිණියෙ හි කිසිවක් විකාශනය වෙමින් තිබේ. පෙරදා රාත්‍රියේ මත්ගතිය ක්‍රමයෙන් පහව යමින් තිබෙන අතර ඔවුන් තිදෙනා අරමුණකින් තොරව රූපවාහිණිය නරඹමින්, හෙට දිනයේ ගමන සහ ඊයේ රාත්‍රියේ දී කපුටු කූඩුවේ සිදු වූ රස වැහෙන සිදුවීම් ගැන දොඩමළු වූ හ. තවත් බීර වටයක් සහ අඩ හෝරාවක් පමණ ගතවෙද්දී බොබී ගේ සොහොයුරිය වූ මේරි ඈන් තැබෑරුමට ඇතුළු වූවා ය. මනා උසකින් හෙබි තඹ කෙස්කාරියක වූ මේරි ඈන්, ඇගේ මිතුරියන්ගේ තරුණ පුතුන් තුළ පවා ප්‍රේම හැඟුම් ජනිත කරවන සුළු තරමේ ශෝභාසම්පන්න තැනැත්තියක වූවාය. නමුත් ඇය තුළ වූ මනස්ගාතවලට ඉඩක් නැති සෘජු සහ දැඩි ස්වභාවය, කිසියම් දෙයක් කෙරෙහි වූ බොබී ගේ අවධානය බිඳ නොවැටී තබා ගැනීමට බොහෝ සේ උපකාරි වූයේ ය.

"ඔහ්... විනාශයි. අන්න අරයා එනවා!"

බොබී බීර බෝතලය සිය බාහුවෙන් වැසෙන පරිදි සඟවා ගන්නා අතර තැළුණු ඇස ආවරණය වන සේ අව් කණ්ණාඩිය පැළඳ ගත්තේ ය. මේරි ඈන් ඔවුන් වෙත ආවා ය.

"මං මෝඩයෙක් කියල ද ඔයා හිතන් ඉන්නෙ..?" ඈ ඇසුවා ය.

බොබී සඟවා ගත් බීර බෝතලය ඉවතට ගත්තේ ය.

"නියමයි..!" ඔහුගේ තැළුණු ඇස දෙස බලමින් මේරි ඈන් කීවා ය.

"පොඩි රණ්ඩුවක් වුණා, ටවුන් එකේ දි..."

UNEDITED SAMPLE PAGE

කෙළවරේ වූ අවසාන නැවතුම්පොළ වූයේ ය. වසර 1970 වනවිට නාගරික සංවර්ධනය ග්ලෝව්සෙස්ටර් මතින් හමා යද්දී ඒත් සමගම එහි පැමිණි මත්ද්‍රව්‍ය වෙළඳාම ද ක්‍රමක්‍රමයෙන් හිස ඔසවන්නට වූ අතර කෙටි කලෙකින් ම දේශීය වශයෙන් ගත් කල වැඩිම හෙරොයින් අධිමාත්‍රා ශරීර ගතවීම් වාර්තාවන නගරය බවට ග්ලෝව්සෙස්ටර් පත් වී තිබුණි. 1984 වසරේ දී ග්ලෝව්සෙස්ටර් නගරට අයත් "වල්හල්ලා" නම් තලපත් ධීවර යාත්‍රාවක් අයර්ලන්ත රිපබ්ලිකන් හමුදාව වෙනුවෙන් ගිනි අවි ප්‍රවාහනය කරමින් සිටියදී අත් අඩංගුවට ගැනුනු අතර බොස්ටන් හි ක්‍රියාත්මක වූ අයර්ලන්ත මාෆියා සංවිධානයක් විසින් මත්ද්‍රව්‍ය හරහා උපයාගත් මුදල් එම අවි මිළ දී ගැනීම සඳහා යොදාගෙන තිබුණි.

1980 දශකයේ අගභාගය වනවිට ජෝර්ජ්ස් බෑන්ක් පාරිසරික පද්ධතිය කඩා වැටීම ආරම්භ වී තිබූ අතර රජයේ නැවත පදිංචිකිරීමේ වැඩපිළිවෙළට සම්බන්ධවීම හරහා ග්ලෝව්සෙස්ටර් නගරයට අවශ්‍ය ආදායම් ලබාගැනීමට බල කෙරිණි. ඒ අනුව ග්ලෝව්සෙස්ටර් නගරය මැසචුසෙට්ස් හි අනෙකුත් නගරවල වැසියන් හට අඩුමිළට නිවාස සැපයූ අතර ප්‍රතිලාභ වශයෙන් රජය වෙතින් නගරයට අවශ්‍ය මූල්‍යාධාර ලබාදෙන ලදී. පිටස්තරයින් වැඩිවැඩියෙන් නගරයට වද්දා ගත් ම නගරයේ රැකියා වියුක්තිය ද ඊට අනුලෝම ව සීඝ්‍ර ලෙස ඉහළ ගිය අතර එය ධීවර කර්මාන්තයට ද අමතර පීඩනයක් එල්ල කිරීමට සමත් වූයේ ය. 1991 වසර වනවිට ජෝර්ජ්ස් බෑන්ක් මුහුදේ මත්ස්‍ය සම්පත සැළකියයුතු අන්දමින් පහත වැටී තිබුණි. ඊට පිළියම් වශයෙන් ජෝර්ජ්ස් බෑන්ක් ප්‍රදේශය තුළ සියලුම ආකාරයේ මසුන් ඇල්ලීමේ කටයුතු දින නියමයකින් තොරව ම නවතාදැමීම වැනි අචින්තනීය කාරණා පවා සාකච්ඡාවට මාතෘකා වූයේ ය. පුරා වසර 150 ක් තිස්සේ කොඩ් තුඩුවට එපිටින් වූ ජෝර්ජ්ස් බෑන්ක් මුහුදු ප්‍රදේශය නවඑංගලන්ත ධීවර ප්‍රජාවට ආහාර සැපයූ "*පාන් බඳුන*" වී තිබූ අතර දැන් එය හුදෙක් නිස්සාර ජලකඳක් බවට පත් ව තිබේ. දසවන ශ්‍රේණියේ දී පාසලෙන් ඉවත්ව රැකියාව සඳහා බෝට්ටුවකට ගොඩවූවෙකු වන චාර්ලි රීඩ් මෙබඳු අවසානයක් ළඟාවන ආකාරය කලින්ම දැක තිබුණේ ය.

"මගෙ දරුවෝ කිසි ම කෙනෙක් මේ මාළු ඇල්ලිල්ලට සම්බන්ධයක් නෑ..." ඔහු කීය. "දරුවෝ මගෙන් ඉල්ලුවා උන්වත් බෝට්ටුවේ දාගෙන මුහුදු ගෙනියන්න. ඒත් මම කිව්වෙ මම උඹලව කොහෙවත් එක්ක යන්නෙ නෑ, බෝට්ටුවෙ. මොකද, උඹලා ඒකට කැමතිවෙන්න ඉඩ තියනවා. ඒක හරිම කුරිරු වැඩක් තමයි, නමුත් උඹලා ඒකට ආසා කරන්න ඉඩ තියනවා."

එතෙල් කපුටු කුඩුවෙ හි සේවය ආරම්භ කරන්නේ 1980

UNEDITED SAMPLE PAGE

අඳුරු, පීඩාකාරී පෙනුමකි. ක්‍රිස්ටිනාගේ අඩුම කුඩුම පිරවූ පෙට්ටි පහත මාලයට රැගෙන ආ ඔවුහු ඒවා ඇගේ වොල්වෝ රථයට පැටවූ හ. විදුලි පහන්, ඇඳුම් පැළඳුම් සහ මල් පැල තොගයක් ද පටවා ගත් පසු ඔවුන් තිදෙනා ද කිටි කිටියේ සිරවෙමින් කාරය ට ගොඩ වී ආතර් වීදියේ වූ නිවාස සංකීර්ණය බලා ගමන් කල හ.

ඒ වන විටත් පෙම්වතෙකු සිටි බැවින් තිආ බග්සි කෙරෙහි උනන්දුවක් නොදැක්වූවා ය. සතුටු සාමිච්යේ යෙදෙමින් බීර වටයක් පානය කරන අතර තුර බොබී සහ බග්සිට සිහි වූයේ ඔවුන්ට මුහුදු ගමන සඳහා 'හොට් ඩෝග්' මිළට ගැනීමට අතපසු වූ බවයි. ගමන සඳහා අවශ්‍ය ආහාර මිළට ගැනීම භාරව හුන් මර්ෆ් විසින් හොට් ඩෝග් මිළට නොගන්නා නිසා ඔවුන් ට හොට් ඩෝග් අවශ්‍යවී නම් ඒවා ඔවුන් විසින් ම සපයා ගත් යුතුව තිබුණි. ඒ අනුව ඈන් තුඩුවේ වෙළඳපොළ වෙත පිටත් වූ බොබී සහ බග්සි මිනිත්තු කිහිපයක ඇවෑමෙන් ඩොලර් පනහක වටිනාකමකින් යුත් හොට් ඩෝග් රැගෙන ආ හ. මධ්‍යහනය ගෙවී ගොස් පිටත්වීමේ මොහොත එළඹෙමින් තිබේ. ක්‍රිස්ටිනා නැවතත් සිය රථය රොජර්ස් වීදිය දෙසට පදවන්නට වූවා ය. ඇය රෝස් මැරීන් ජැටිය අයත් බොරළු සහිත රිය නැවතුම් පොළෙ හි සිය රථය නැවැත්වූ විට බොබී සහ බග්සි සිය හාට් ඩෝග් ද රැගෙන ජැටිය මත සිට 'ඇන්ඩ්‍රියා ගේල්' හි තට්ටුව මතට පැන්නෝ ය.

ඔවුන් බෝට්ටුව මත ඔබමොබ යන දෙස බලාගත් වන ම ක්‍රිස්ටිනා කල්පනාවට වැටුණා ය. මේ ශීත සෘතුවේ දී බොබී බ්‍රැඩෙන්ටන් බලා යනු ඇත. ඊළඟ ගිම්හානයේ දී නැවත මෙහි පැමිණිය ද වරෙකට පුරා මාසය බැගින් නැවතත් ඔහු මුහුද බලා යනු ඇත. දැන් ඉතිං සියල්ල සිදුවනු ඇත්තේ එ'ආකාරයෙන්. බොබී තලපත් දඩයම්කරුවෙකු පමණක් නොව සෑහෙන මුදලක් ආපසු ගෙවීමට නියමිත ණයකරුවෙකු ද විය. කෙසේ නමුත් අඩුම තරමේ, ඔවුන් සතුව සැලසුමක් තිබේ. සිය පසුගිය මුහුදු ගමනේ ගාස්තුව ලෙස ලැබිය යුතු මුදල ක්‍රිස්ටිනා හට ගෙවන මෙන් බොබී, බොබ් බ්‍රවුන් සමඟ කතිකා කොටගෙන තිබුණි. ක්‍රිස්ටිනා ඩොලර් තුන් දහසක් තරම් වූ ඒ මුදලින් බොබීගෙ ණය වලින් කොටසක් ගෙවා දමා ඉතිරියෙන් ඈන් තුඩුවේ උතුරු වෙරළබඩ ලේන්ස්විල් ප්‍රදේශයෙන් ඔවුන් දෙදෙනා වෙනුවෙන් නිවෙසක් මිළට ගනු ඇත. එ නයින් සමහර විට, ඔවුන් කපුටු කූඩුවේ ගතකරන කාලය අවම වනු ඇත. ඈය ට රැකියාවන් දෙකක් ලැබීමට නියමිත ව තිබේ; ඉන් එකක් රොක් පෝර්ට් හි ඕල්ඩ් ෆාම් නම් වූ අවන්හලක වූ අතර අනෙක ඇගේ මිතුරියක ගේ ආබාධිත දරුවෙකු රැක බලාගැනීම ය. ඔවුන් සිය බලාපොරොත්තු සඵල කරගනු ඇත.

UNEDITED SAMPLE PAGE

බොබී වැඩි කාලයක් නිවසෙන් පිටත සිටිනු ඇති නමුදු අවසානයේ දී කෙසේ හෝ ඔවුන් එය සඵල කරගනු ඇත.

එක් වරම බෝට්ටුව දෙසින් ඇසුණේ ඝෝෂාවකි. ඇද හැළුණු පොද වැස්සේ ජැටිය මත මුහුණට මුහුණලා සිටගෙන හුන් බග්සි සහ බොබී යම් දෙයක් වෙනුවෙන් දබර කරගන්නා ආකාරයක් පෙණුනි. අත තිබූ විරංජන ද්‍රාවණයක් අඩංගු බෝතලයක් බෙදාගනු වස් ඔවුන් අතර ගැටුමක් හට ගෙන තිබුණු අතර දෙදෙනාගෙන් කවුරුන් හෝ එකෙකු විසින් අනෙකා වෙත දැවැන්ත මුෂ්ටි ප්‍රහාරයක් එල්ල කිරීමට තිබුණේ තවත් සුළු මොහොතකි. නමුත් එසේ සිදු වූයේ නැත. ගැටුම අත්හල බොබී යළිත් තමන් කරමින් සිටි කාර්යයෙ හි යෙදෙනු වස් කෙළ ගසමින්, නොසරුප් වදන් උතුරා යන මුවින් යුතු ව ශාප කරමින් ආපසු හැරුණේ ය. ඒ දෙස බලා සිටින අතර සලී නම් වූ තවත් ධීවරයෙකු බොරළු පිටිය හරහා තම මෝටර් රථය දෙසට පා නගනු ක්‍රිස්ටිනා ඇස් කොණින් දුටුවා ය. ක්‍රිස්ටිනා අසළට ම පැමිණි ඔහු මෝටර් රථයේ වීදුරුව දෙසට නැඹුරු වී ඇය ඇමතුවේ ය.

"...මටත් මේ බෝට්ටුවෙ රස්සාවක් හම්බවුණා. කවුරු හරි එන්න පස්ස ගහපු කෙනෙක් වෙනුවට මාව ගත්තා."

ඔහු බෝට්ටුවේ හුන් බග්සි සහ බොබී දෙස බැලීය.

"...මේ මගුල විශ්වාස කරන්න පුලුවන් ද? දවස් තිහක් එකට ඉන්න ඕනෙ. මුන් දැන්ම ම පටන් ගෙන!"

ඇන්ඩ්‍රියා ගේල් වූ කලී තියුණු ඇණියක් ද, හතරැස් පතුලක් සහ අවර කොටසේ සවි කළ කුඹ වලින් ද යුක්ත වූ තලපත් දඩයම් යාත්‍රාවක් වූවා ය. එ නම් ඇගේ ඇණිය, ජල තලයට සාපේක්ෂව වැඩි ආනතියකින් යුක්ත වූ අතර හරස්කඩ සැළකු කල් හි වඩා සතරැස් පෙනුමක් සහිත වූයේ ය. සාමාන්‍යයෙන්, යාත්‍රාවක පසුපස කොටසට ආසන්නයෙන් පිහිටා තිබෙන්නා වූ නියමු කුටිය වෙනුවට වඩා ඉදිරිපසින් වූ - වේල් බැක් ඩෙක් නමින් හැඳින් වූ - අමතර උස් තට්ටුවක් මත සවි කළ නියමු කුටියක් ඇය සතු විය. වර්ෂ 1978 දී ෆ්ලොරිඩාවේ පැනමා සිටි හි දී නිෂ්පාදනය කරන ලද ඇන්ඩ්‍රියා ගේල්, දිගින් අඩි 72 වූ අතර ඇගේ බඳ, සම්පූර්ණ වශයෙන් එකිනෙක පාස්සන ලද වානේ තහඩු වලින් නිර්මිත වී තිබුණි. එහි වූ අශ්ව බල 365ක අධි-බලැති ඩීසල් එන්ජිම, පැයට නාවික සැතපුම් දොළහක තරම් වේගයක් ලබා දීමට සමත් වූයේ ය. ජීවිතාරක්ෂක ඇඳුම් හයක්, හදිසි අවස්ථාවක දී පිහිටීම දක්වමින් මෙගා හර්ට්ස් 406 ඔස්සේ රේඩියෝ සංඥා නිකුත් කල හැකි උපකරණයක් (නාවිකයන් මෙය හඳුන්වන්නේ EPIRB

UNEDITED SAMPLE PAGE

යනුවෙනි), මෙගා හර්ට්ස් 121.5 ඔස්සේ හදිසි රේඩියෝ සංඥා නිකුත් කල හැකි තවත් උපකරණයක්, ස්වයංක්‍රීයව දිග හැරෙන මාදිලියේ ජීවිතාරක්ෂක පහුරක් ඇතුළු පළමු කාණ්ඩයේ ජීවිතාරක්ෂක උපාංග වර්ග හතකින් ඇන්ඩ්‍රියා ගේල් සමන්විත වී තිබුණි. සැතපුම් හතළිහක දිගකින් යුතු වූ, රාත්තල් 700 ක තරම් භාරයක් දැරීමේ හැකියාව තිබූ තංගුස් යොතක් ද, බිලි කොකු දහස් ගණනක් ද, ඇම සඳහා යොදා ගන්නා හිගුරන් ටොන් පහක් පමණ ඇසිරිය හැකි ගබඩා ද ඇය සතු විය. එසේ ම ඇය, දිනකට අයිස් ටොන් තුනක් නිපදවිය හැකි වූ අයිස් නිෂ්පාදන යන්ත්‍රයක් ද රේඩාර්, ලොරැන්, තනි පැති කලාප (Single side band) රේඩියෝ උපකරණ, අධි සංඛ්‍යාත VHF රේඩියෝ සහ චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ක්‍රියාකරන කාළගුණ තොරතුරු ප්‍රතිග්‍රාහක යන්ත්‍ර ආදී නවීන තාක්ෂණික උපකරණ වලින් සමන්විත තියමු කුටියකින් ද පොහොසත් යාත්‍රාවක් වූවා ය. ඒ සියල්ලට අමතර ව රෙදි සෝදන සහ වියළන යන්ත්‍රයක් ද, දැව අනුකාරක මුළුතැන්ගේ මේසයක් සහ ලිප් හතරේ උඳුනක් ද ඇන්ඩ්‍රියා ගේල් සතු වූවා ය.

ඇන්ඩ්‍රියා ගේල්, ග්ලෝච්සෙස්ටර් වරායේ වූ යාත්‍රා අතරින් ඉහළම මුදලක් ඉපැයූ යාත්‍රාවක් වූවා ය. ඇන්ඩ්‍රියා ගේල් හි ස්ථානයක් ලබාගනු පිණිස බිලී ටයින් සහ බග්සි මොරැන් ෆ්ලොරීඩාවේ සිට මෙහි පැමිණියේ එබැවිණි. ඇය අතිබහුල මසුන් ඇල්ලීමට හැකි යාත්‍රාවක් එහි වූයේ නම් ඒ නිසැකව ම ලින්ඩා ග්‍රීන්ලෝ කපිතාන් වශයෙන් සේවය කල හැනා බෝඩෙන් පමණක් විය. කොල්බි විද්‍යාලයෙන් සිය උපාධිය හිමි කරගත් ලින්ඩා, බෝට්ටු රැකියාවේ යෙදුනු එක ම කාන්තාව වූ අතර විවාදයකින් තොරව ම, නැගෙනහිර වෙරළේ හුන් දක්ෂතම කපිතාන්වරුන් අතරින් කෙනෙකු ද වූවා ය. වසරින් වසර, දඩයම් වාරයක් පාසා ඇය වෙනත් කිසිදු බෝට්ටුවකට නොහැකි වූ තරම් මුදල් උපයන්නට සමත් වූවා ය. ඇන්ඩ්‍රියා ගේල් සහ හැනා බෝඩෙන් යන යාත්‍රා දෙකෙහි ම හිමිකරුවා වූයේ බොබ් බ්‍රවුන්ය. ඔවුන් වරෙකට කෙතරම් මසුන් ප්‍රමාණයක් රැගෙන එන්නේදැයි කිවහොත්, එතෙල් ගේ තවත් පුත්‍රයෙකු වූ රිකී, හවායි හි සිට දුරකථන ඇමතුම් ලබාදෙමින් ඔවුන් වරායට පැමිණ ඇත්දැයි විමසන්නට පුරුදු වී සිටියේ ය. හැනා බෝඩෙන්, ග්ලෝච්සෙස්ටර් වරායේ සිය මත්ස්‍ය අස්වැන්න ගොඩබාන විට, ලෝකයේ අනෙක් පැත්තේ තලපත් වෙළඳපොළ මිළ සීග්‍රයෙන් පහත වැටෙන්නට පටන්ගන්නා බව කියැවුණි.

ඒ කෙසේ වුව ද, මේ දක්වා බිලීගේ දෙවන ඇන්ඩ්‍රියා ගේල් මුහුදු ගමනට ලැබී තිබුණේ තරමක නරක ආරම්භයකි. ඔහුගේ සගයින් මුළු සතියක් තිස්සේ හොඳහැටි මධුවිතෙන් සප්පායම් ව

UNEDITED SAMPLE PAGE

සිටි අතර ඔවුන් කිසිවෙකු යහපත් මනෝ භාවයකින් නොසිටියේ ය. ඔවුන් කිසිවෙකුට නැවත මුහුදට යෑමේ උවමනාවක් නොවී ය. පසුගිය දින කිහිපයක් මුළුල්ලේ බෝට්ටුවේ වැඩකටයුතු කිරීමට ගත් සියලු උත්සාහයන් අවසාන වූයේ එක්කෝ දබරයකිනි. නැත්නම් වීදියෙන් එ පිට වූ තැබෑරුමෙනි. ඒ සැප්තැම්බර් මාසයේ විසිවැනි දා වූ අතර දඩයම් වාරය අවසාන වීමට තිබුණේ තවත් ඉතා සුළු කාලයක් වූ නමුදු තවමත් බිලී ටයින්ට සිය බෝට්ටුව සඳහා සුදුසු සම්පූර්ණ කණ්ඩායමක් තෝරාගැනීමට නොහැකි වී තිබුණේ ය. නිව් යෝර්ක් නගරයේ උපන්, ජැමෙයිකානු සම්භවයක් සහිත හිතහොඳ දැවැන්තයෙකු වූ ඇල්ෆ්‍රඩ් පියරේ සිය පෙම්වතිය ද සමඟ කපුටු කූඩුවේ උඩු මහලේ වූ කාමරයක් තුළ සැඟ වී හුන්නේ ය. විටෙක ගමනට කැමැත්ත පළකල ඔහු ඊළග මොහොතේ යළිත් නොහැකි බව කීය. එක් ඇසක් ඉදිමී නිල් පැහැ වී හුන් බොබී ද වෙරිමතින් කොහේ හෝ ඉබාගාතේ ගොස් තිබේ. ගැහැණු ස්පර්ශයක් නොලැබුණු බැවින් බග්සි ගේ තත්වය ද අජූව වූයේ ය. මුදල් පිළිබඳ අවලාද නැගූ මර්ෆි සිටියේ සිය දරුවා ගැන සාංකාවෙන් පෙළෙමිනි. තත්වය තවත් නරක අතට හැරුණේ එක් නවක සගයෙකු කිසිම හේතුවක් නොදක්වා එදින උදෑසන හදිසියේ ඉවත්ව යාමත් සමඟ ය.

කලින් වතාවේ මුහුදු ගමනට එක් ව හුන් කණ්ඩායමේ සාමාජිකයෙකු වූ ඩග් කොස්කෝ වෙනුවෙන් පැමිණි නවක ආදේශකයා වූ හේ ඇඩම් රැන්ඩල් නම් විය. මැසචුසෙට්ස් නගරයේ නැගෙනහිර බ්‍රිජ්වෝටර් සිට ඇන්ඩ්‍රියා ගේල් හි රැකියාව වෙනුවෙන් එදින උදෑසන ඔහු පැමිණ සිටියේ සිය මාමණ්ඩිය සමඟ ය. ඔහු සිය රථය රෝස් ජැටියේ වාහන නැවතුම්පොළෙ හි නවතා බෝට්ටුව නරඹනු පිණිස ජැටිය දෙසට ගමන් කළේ ය. සුනම්‍ය සිරුරකින් හෙබි තිස් හැවිරිදි රැන්ඩල්, නිල් පැහැ දෙනෙතකින් ද රොක් සංගීත තරුවක් බඳු තඹපැහැ කොණ්ඩයකින් ද යුතු වූ කඩවසම් තරුණයෙකු විය. වෑද්දුම්කරුවෙක්, ඉංජිනේරුවෙක් සහ ස්කුබා කිමිදුම් කරුවෙක් ආදී වශයෙන් විවිධ හැකියාවන් ඇත්තෙකු වූ හෙතෙම සිය ජීවිත කාලය තිස්සේ මසුන් ඇල්ලීමෙහි යෙදී තිබුණේ ය. අනාරක්ෂිත යාත්‍රාවක් දුටුවන ම හඳුනා ගැනීමේ හැකියාව ඔහු සතු විය. ඇන්ඩ්‍රියා ගේල්, වෙනත් ඕනෑම දෙයක් විය හැකි වූ නමුදු කිසිවිටෙක අනාරක්ෂිත යාත්‍රාවක් නම් නොවූවා ය. ඇයට තිබුණේ ගුවන් යානා ප්‍රවාහන නෞකාවක් සමඟ වුව ද ගැටෙන්නට හැකියාව ඇති තරමේ ශක්ති සම්පන්න පෙනුමකි. ඊට අමතරව එහි කණ්ඩායම් සඟයින් ද ඔහු හොඳින් දන්නා හඳුනන අය වූ හ. ඒ සියල්ලට ම වඩා, ඔහුගේ පෙම්වතිය නොකියා කීවේ,

UNEDITED SAMPLE PAGE

බෝට්ටුවේ රැකියාවට නොයන්නේ නම් නැවත නිවෙසට පැමිණීම ගැන කරදරවීමට අවශ්‍යනොවන බව ය. පසුගිය මාස තුනක් තිස්සේ ඔහුට කිසිඳු රැකියාවක් නොතිබුණේ ය. ආපසු හැරුණු රැන්ඩල් සිය මෝටර් රථය දෙසට ඇවිද ගියේ ය. විස්තර කළ නොහැකි කිසියම් ගුප්ත හැඟීමක් තමන් ට දැනෙන බව මාමණ්ඩියට පැවසූ ඔහු අසළ වූ අවන්හලක් කරා යන අටියෙන් සිය රථය හරවා ගත්තේ ය.

අශුභ නිමිති!

ජීවිත අවදානමක් ඇති කාර්යයන් හි නිරත වනවිට බොහෝදෙනා නිරන්තරයෙන් අශුභ පෙරනිමිති අත්දකිති. තවමත් අතිශය අනතුරුදායක රැකියාවක් ලෙසින් සැළකෙන වාණිජ ධීවර කර්මාන්තයේ යෙදෙන්නන් හට ද නිතර ම පාහේ එවැනි අශුභ නිමිති අසන්නට දකින්නට ලැබේ. සමර්ථකම වන්නේ ඒවා හරිහැටි තෝරා බේරා ගැනීම යි. වර්ෂ 1871 දිනෙක, ජෝර්ජස් බැන්ක් මුහුදේ මසුන් ඇල්ලීම සඳහා ගිය සේවම් නම් යාත්‍රාවක කෝකියා වශයෙන් කටයුතුකළ ජේම්ස් නෙල්සන්, එක ම සිහිනය යළි යළිත් දැකීම හේතුවෙන් අවදි වන ලදු ව කප්පිත්තා සොයා දිව ගියේ ය.

"දෙයියන්ගේ නාමයෙන් ග්‍රෑන්ඩ් බැන්ක්ස් පැත්තෙන් ඈත්වෙලා ඉන්න!" ඔහු ආයාචනා කළේ ය. "කලින් මේ හීනෙ දැකපු දෙවාරෙම මං හිටි බෝට්ටුව මුහුදුබත් වුණා."

යාත්‍රාවේ කප්පිත්තා වූ වෙන්සෙල්, යහමින් පදම් වූ නැවියෙකු වූයේ ය. ඔහු ජේම්ස් දුටු සිහිනය පිළිබඳ විමසීය.

"...සුදු ඇඳගත්ත ගෑනු ! හිටගෙන හිටියා, වැස්සේ තෙමි තෙමි!"

යාන්තම් සුළඟකුදු නොවූ හෙයින්, ජේම්ස් දුටු සිහිනයට, වෙන්සෙල් ගේ හිත වෙනස් කිරීමට තරම් හැකියාවක් නොතිබුණේ ය. වෙන්සෙල් සිය කෝකියා යළිත් නින්දට යනු පිණිස පිටත් කළේ ය. මද වේලාවකට පසුව සුළං වේගයේ කිසියම් වැඩිවීමක් දක්නට ලැබුණි. හෝරාවක් ඉක්මයාමටත් මත්තෙන්, සුළඟ ඉතා තදින් හමායන්නට වූ අතර ඉදිරි රුවල අඩවල් කෙරුණු සේවම්, සුළඟට මුහුණලා සිටින සේ හරවන ලදී (රළු කාළගුණයක දී මුහුදු යාත්‍රා සුළඟට මුහුණලා හැරවීමෙන් යාත්‍රාවට අඩු බලපෑමක් සහ වැඩි පාලනයක් හිමිවේ - පරිවර්තක). බඳට සිදු වූ හානි කරණ කොටගෙන බෝට්ටුව තුළට ජලය ගලා එන්නට වූ බැවින් වහා ක්‍රියාත්මක වූ නාවික පිරිස

UNEDITED SAMPLE PAGE

යුහුසුලු ව සිය පොම්ප ක්‍රියාත්මක කොට ජලය ඉවත් කරන්නට වූ හ. පොම්ප කිරීම මගින් තවදුරටත් ජලය ඉවත් කළ නොහැකි වූ කල් හි බලාපොරොත්තු සුන් වූ වෙන්සෙල්, අසළ වූ තවත් ග්ලෝච්සෙස්ටර් ස්කූනර් යාත්‍රාවක් වූ පෙස්කාඩොර් වෙතින් උදව් ඉල්ලා සංඥා නිකුත් කළේ ය. පෙස්කාඩොර්, සිය කුඩා ඩෝරි ඔරු යොදාගනිමින් සේවම් හි නාවික කණ්ඩායම බේරාගැනීමට සමත් වූ අතර තවත් අඩ හෝරවක් පමණ ගෙවී යද්දී පැත්තට පෙරළී ගිය සේවම්, ඇණිය පහළට සිටින ආකාරයෙන් හැරී සමුදුරු දියෙහි සැඟව ගියා ය.

සහජාශය සැළකීමත්, සැකයට සවන්දීමත් අද ද සිදු වේ. රැන්ඩල්ගේ නික්මයාමත් සමඟ ඒ වෙනුවට වෙනත් අයෙකු සොයාගැනීමට ටයින්ට සිදු වූයේ ය. දුරකථන ඇමතුම් කිහිපයකින් අනතුරුව ඔහුට, 28 හැවිරිදි ඩේවිඩ් සලිවන් හෙවත් සලී හමුවී තිබුණි. ජනවාරි මාසයේ එක්තරා ශීතල දිනයක, අනතුරට පත් සිය යාත්‍රාවේ හුන් සඟයින් බේරාගැනීමට සඳහා සිය දිවි නොතකා කටයුතු කිරීම හේතුවෙන් ඔහු නගරවාසීන් අතර යම් තරමක ප්‍රසිද්ධියට පත්ව සිටි අයෙකු විය. සලී එවකට සේවය කළේ හාමොනි නම් යාත්‍රාවේ ය. හාමොනි හි බඳ සිදුරු වී ජලය ගලා එන විට ඇය සහ තවත් යාත්‍රාවක් කඹ මගින් එකිනෙක ඈඳා තිබුණි. හාමොනි හි කණ්ඩායම උදව් ඉල්ලා කෑ ගැසුව ද, අනෙක් යාත්‍රාවේ ධීවරයන් ඒ වන විටත් තද නින්දේ පසුවූ බැවින් ඔවුන් අවදි කරගැනීමට ඒ කෑ ගැසීම්වලට හැකියාවක් නොවී ය. උතුරු අත්ලාන්තික් සාගරයේ අයිස් මිදෙන තරම් ශීතල ද නොතකා එක්වරම දියට පැන ගත් සලී, කඹය අල්ලාගෙන අනෙක් බෝට්ටුව දෙසට පිහිනා ගොස් උදව් රැගෙනවිත් තිබුණි. වෙනත් අයුරින් කිවහොත් ඩේවිඩ් සලිවන් වූ කලී බෝට්ටුවක 'සිටිය යුතු' වර්ගයේ වටිනා මිනිසෙකු වූයේ ය.

ඔහු කැටුව යාම සඳහා තවත් අඩ හෝරාවකින් පමණ තමන් පැමිණෙන බව බිලී ටයින් විසින් දැනුම් දී තිබුණි. මුහුදු ගමන සඳහා අවශ්‍ය අඩුවැඩිය මල්ලක දමා ගත් සලී, දුරකථන ඇමතුම් කිහිපයක් ගත්තේ තමන් ටික කාලයකට බැහැර යන බව සිය හිත මිතුරන් හට දන්වනු පිණිස ය. සවස් වරුව සඳහා වූ සලීගේ සැලසුම් ඒ ආකාරයෙන් නිමා වී ගියේ ය. ඔහුගේ ජීවිතය තවත් මාසයක කාලයක් සඳහා නතරවනු ඇත. පස්වරු දෙක වනවිට බිලී පැමිණි අතර ඔවුන් බොබී සහ බග්සිගේ ගැටුම දුටුවේ එසේ රෝස් ජැටිය අසළ ට ළඟා වූ මොහොතේ ය.

"නියමයි" එසේ සිතූ සලී, ක්‍රිස්ටීනා හට ආචාර කරනු පිණිස මඳක් නැවතුණු අතර ඩොලර් හාරදහසක මුදලකින් ඔහුගේ සාක්කුව පිර

UNEDITED SAMPLE PAGE

වූ බිලී ටයින්, මර්ෆ් ද කැටුව ඇන් තුඩුවේ වෙළඳසැල් වෙත ගොස් ගමන සඳහා අවශ්‍යකරන ආහාරපාන මිළට ගන්නා ලෙස දන්වා සිටියේ ය.

වාණිජ ධීවර කර්මාන්තය පිළිබඳ එක් වැදගත් ම කාරණයක් වූයේ, ඒ හා සබැඳි සෑම දෙයක්ම පාහේ අත්‍යන්ත වීම ය. මුහුදු යන්නෝ වැඩකරන්නේ සාමාන්‍ය ලෝකයේ මිනිසුන් වැඩකරනා ආකාරයෙන් නොවේ. එක දිගට පුරා මාසයක් මහ මුහුදේ ගත කරනා ඔවුහු ආපසු පැමිණි පසු පුරා සතියක් තිස්සේ විනෝද වෙති. ඔවුහු මුදල් උපයන්නේ ද සාමාන්‍ය මිනිසුන් උපයනා ආකාරයෙන් හෝ ප්‍රමාණ වලින් නොවේ. විටෙක මුළුමණින් ම අසාර්ථක වී හිස් අතින් ආපසු ගොඩබිම බලා එන ඔවුහු, තවත් විටෙක එන්නේ ඩොලර් මිලියන කාලක් තරම් වටිනාකමකින් යුතු මසුන්ගෙන් සිය බෝට්ටු ගබඩා පුරවාගෙන ය. එ'ආකාරයෙන් ම, මාසයක මුහුදු ගමනක් සඳහා ආහාරපානාදිය මිළට ගැනීමේ දී ද එය මිළ දී ගැනීමක් ලෙස සාමාන්‍ය කෙනෙකුට හැඟෙන්නේ නැත. එය, සැබැවින් ම, ඉතිහාසගතවන අන්දමේ සිල්ලර සංහාරයක් වන්නේ ය.

මාර්ග අංක 127 හි පිහිටා තිබූ වෙළඳසැල වෙත ගිය මර්ෆ් සහ සලී, රාක්ක අතර ඔබ මොබ යමින්, අතට හසුවන දෙයින් සිත් සේ සිය අත් කරත්ත පුරවා ගන්නට පටන් ගත් හ. පාන් රාත්තල් පනහක් සඳහා කරත්ත දෙකක සම්පූර්ණ ඉඩ අවශ්‍යවිය. අර්තාපල් රාත්තල් සියයක්, එළු රාත්තල් තිහක්, කිරි ගැලුම් විසි පහක් සහ ඩොලර් අසූවක් පමණ වූ මස් කුට්ටි ද ඊට එක් කෙරිණි. අත් කරත්ත සංඛ්‍යා දහය, පහළොව, විස්ස ආදී වශයෙන් වැඩි වත් ම අවට සිටියවුන් කම්පිත දෑසින් ඔවුන් දෙස බලමින් මාර්ගය ඉඩ දුන් හ. අයිස් ක්‍රීම් සැන්ඩ්විච්, කප් කේක්, බිත්තර සහ බේකන්, පීනට් බටර්, අනර්ඝ තත්වයේ හරක් මස්, චොකලට් තැවරූ ධාන්‍යයමය ආහාර, ස්පැගෙති, ලසඤ්ඤා සහ ශීත කල පීසා ආදී මෙකී නොකී දෑ බොහොමයක් ද පටවා ගැනුණි. තෝරාගත් සියල්ල ඉහළම තත්වයේ ආහාර වූ අතර ඔවුන් මිළ දී නොගත් එක ම දෑ වූයේ මාළු පමණි. අවසානයේ දී සිගරට් පෙට්ටි තිහකින් තවත් අත් කරත්තයක් පුරවාගත් දෙදෙනා, මළ නොබැඳෙන වානේවලින් නිර්මිත ගවයින් රැළක් දක්කන්නාක් මෙන් සිය අත්කරත්ත රැස ද රැගෙන කවුන්ටරය වෙත ගමන් කළ හ. ඔවුන් වෙනුවෙන් මුදල් කවුළු දෙකක් විවෘත කිරීමට වෙළඳසැල කටයුතු කළ අතර මුදල් ගෙවීමේ කටයුතු අවසන් වන විට තවත් අඩ හෝරවක් පමණ ගත වී තිබුණි. සලී මුදල් ගණුදෙනු සිදුකරන අතරතුර මර්ෆ් සිය ට්‍රක්රථය පැටවුම් ස්ථානය වෙත රැගෙන ආවේ ය. මිළට ගත් සියල්ල ට්‍රක්රථයට පටවා ගැනීමෙන් අනතුරු ව නැවතත් රෝස් ජැටිය වෙත

UNEDITED SAMPLE PAGE

ගිය ඔවුහු, රැගෙන ආ ඩොලර් හාරදහසක වටිනාකමින් යුතු බඩු මළු එකින් එක ඇන්ඩ්‍රියා ගේල් හි මත්ස්‍ය ගබඩාවල අසුරන්නට වූ හ.

ඇන්ඩ්‍රියා ගේල් සතුව, මුළුතැන්ගෙයි සවිකරන ලද කුඩා ශීතකරණයක් ද ගබඩාවන් හි ටොන් විස්සක අයිස් ද විය. දියඹ බලා යන ගමනේ දී ඇමට ගන්නා මසුන් සහ ආහාරපානාදිය කල් තබා ගැනීමටත්, ආපසු එන ගමනේ දී තලපත් මසුන් ගබඩා කිරීමටත් මෙම අයිස් තොගය යොදාගනී. අත්‍යාවශ්‍යම වුවහොත්, ගමනේ දී මියැදෙන ධීවරයෙකුගේ මළ සිරුරක් නරක් නොවී තබාගැනීමට ද මෙම අයිස් භාවිතා හැකි විය. වරෙක හැනා බෝඩන් හි සේවය කළ එක් මත්පැන්ලෝලී මහළු ධීවරයෙකු, මුහුදු ගමන අතරතුර මියගොස් තිබුණි. වෙරළාරක්ෂකයින් මළ සිරුර ඉවත් කිරීම සඳහා ගුවන් සහය ලබාදීම ප්‍රතික්ෂේප කළ හෙයින් සිරුර අයිස්වල බහා මත්ස්‍ය ගබඩාවක තැන්පත් කිරීම ට කපිතාන් ලින්ඩා ග්‍රීන්ලෝ හට සිදු වූයේ ය.

අයිස් වලින් තොරව මත්ස්‍ය කර්මාන්තයට පැවැත්මක් නොවී ය. සමහර විට, ඩීසල් එන්ජින්, ලොරන් යන්ත්‍ර, කාලගුණ නිරීක්ෂණ යන්ත්‍ර හෝ හයිඩ්‍රොලික් දොඹකර නොමැතිව වුව ද කර්මාන්තය පවත්වාගෙන යා හැකිව තිබුණ ද අයිස් නොමැතිව එසේ නොවුණේ, නැවුම් මසුන් මුහුදේ සිට වෙළදපොළට රැගෙන ඒමට වෙනත් ක්‍රමයක් නොතිබූ බැවිනි. මුල් කාලයේ දී, ග්‍රෑන්ඩ් බැන්ක්ස් ප්‍රදේශයේ මසුන් දඩයම් කිරීමෙන් පසුව නැවත නිවෙස් බලා යාමට ප්‍රථමයෙන්, සිය මත්ස්‍ය අස්වැන්න ලුණු දමා වේලාගනු පිණිස නිව්ෆවුන්ඩ්ලන්ඩ් වෙත යාමට ධීවරයින් පුරුදු වී සිටිය හ. නමුත් වර්ෂ 1840 වන විට දුම්රිය මාර්ග ඇතිවීමත් සමග ඒ සියල්ල වෙනස් වී ගියේ ය. එක්වරම, ආහාර නරක්වීමේ වේගයට වඩා වැඩි වේගයකින් ඒවා ප්‍රවාහනය කිරීමේ හැකියාව ලැබී තිබුණු අතර ඒ වෙනුවෙන් පහසුකම් සැපයීම සඳහා අයිස් කර්මාන්තශාලා ඇති වූයේ රැයක් එළිවෙන තරම් වේගයෙනි. ශීත සෘතුවේ දී දිය මිදුණු පොකුණු වලින් කපාගන්නා ලද අයිස් කුට්ටි, ලී කුඩු වලින් මනාකොට ආවරණය කරන ලදුව, ගිම්හාන මාසවල දී ස්කූනර් යාත්‍රා වෙත අලෙවි කෙරුණි. ක්‍රමවත් ව අසුරණ ලද අයිස් බොහෝ කල් දිය නොවී පැවති අතර ඒවායේ වටිනාකම කෙසේ වී ද යත් වෙළෙඳුන් හට ඒවා ඉන්දියාව තරම් ඈත රටවලට පවා නැව්ගත කිරීමෙන් වුවද ලාභ ඉපදවිය හැකි තරම් විය.

ධීවර කර්මාන්තය සදාකාලිකව ම වෙනස් කිරීමට හේතු වූයේ නැවුම් මසුන් සඳහා තිබූ වෙළඳපොළ ය. ලුණු දැමූ කොඩ් මසුන්ගෙන් සිය ගබඩා පුරවාගත් ස්කූනර් යාත්‍රා කප්පිත්තෙකුට තව දුරටත් සිය අභිමතය පරිදි ඉස්පාසුවේ ආපසු පැමිණීමේ හැකියාවක්

UNEDITED SAMPLE PAGE

විසිවෙමින්, අනේකවිධ හඬ නගමින් කුඩා පතුරුවලට කැඩී වෙන්වී යයි. මෙම කුඩා අයිස් පතුරු, අනතුරුව නළයක ආධාරයෙන් ජැටියේ නවතා ඇති ධීවර යාත්‍රාවන් හි ගබඩා තුළට පුරවනු ලැබේ.

කේප් පොන්ඩ් වූ කලී ග්ලෝව්සෙස්ටර් ජල තීරයේ පිහිටා තිබූ සිය ගණනක් වූ ව්‍යාපාර අතරින් තවත් එක් ව්‍යාපාරයක් පමණක් විය. වරායට පැමිණෙන යාත්‍රා, සිය මසුන් තොග ගොඩබෑමෙන් අනතුරුව ඊළඟ සතියක පමණ කාලය ගත කරන්නේ අවශ්‍ය නඩත්තු කටයුතු සිදුකරමින් සහ ඊළඟ මුහුදු ගමන සඳහා අවශ්‍ය බඩු බාහිරාදිය රැස් කරමිනි. තරමක විශාල ප්‍රමාණයේ රළකට, තත්පර කිහිපයක කාලයක් සඳහා තලපත් බෝට්ටුවක් සම්පූර්ණයෙන්ම ගිලගැනීමට පුළුවන. "කිසිම දෙයක් නෑ. ඝන අන්ධකාරෙ හැර!"- ලින්ඩා ග්‍රීන්ලෝ ඒ ගැන සිය අත්දැකීම් එසේ විස්තර කරන්නී ය. දරුණු රළ ප්‍රහාරයකින් සිදුවන හානිය පිළිසකර කිරීමට දින ගණනක් හෝ සමහරවිට සති ගණනක් ගතවිය හැකිය. ග්ලෝව්සෙස්ටර් මැරීන් රේල්වේස් සමාගම, වර්ෂ 1856 දී පමණ සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ අතර ග්ලෝව්සෙස්ටර් හි බොහොමයක් බෝට්ටු අලුත්වැඩියා කටයුතු සිදුවූයේ ඔවුන් වෙතිනි. ජලය තුළට විහිදෙන දුම්රිය මාර්ගයක් බඳු පීලි දෙකකින් සැදි ව්‍යුහයකට සවිකරන ලද, පීලි මත ගමන් කළහැකි ආකාරයෙන් වානේ රෝලර් යෙදූ යෝධ දැවමුවා රාමුවක් එහි තිබුණි. රාමුව පීලි ඔස්සේ ජලය තුළට පහත් කිරීමෙන් අනතුරුව බෝට්ටුව ඒ තුළට ඇතුල් කරනු ලැබේ. ටොන් හය සියයක් තරම් බරැති යාත්‍රා ව, රාමුව තුළ මනා කොට ගැට ගැසීමෙන් අනතුරුව දැවැන්ත වානේ දැතිරෝද යාන්ත්‍රණයකට ඈඳූ අඟලක් පමණ ඝනකම ඇති දම්වැල් දෙපොටක් මඟින් රේල් පීලි දෙක මතින් ගොඩබිමට අදිනු ලැබේ. දැතිරෝද යාන්ත්‍රණය සියවසකට පමණ පෙර තැනූවක් වූ අතර එදා පටන් මේ දක්වා එහි කිසිදු වෙනස්කමක් සිදුකර නොමැත. ඔවුන් සතුව එවැනි පීලි යාන්ත්‍රණ තුනක් වූ අතර ඉන් එකක් ඇතුල් වරායේ ද, ඉතිරිය රොකී නෙක් වරායේ ද පිහිටා තිබුණි. ඒ අතරින් ශක්තිමත් භාවය අඩුම වූ ඇතුල් වරායේ වූ පීලි යන්ත්‍රය, මුස්ලිම් ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ සහිත ගඩොල් ආරුක්කු යුගලකින් සමන්විත වූ, තෙල් සහ ග්‍රීස් වලින් පෙඟී ගිය කුඩා බිම් මහලක් තුළට විහිදී ගියේ ය. රොකී නෙක් හි වූ අනෙක් රේල් මාර්ග දෙක තිබූ වටපිටාවේ ජනප්‍රිය කලාගාරයන් සහ සජීවී සංගීතය සහිත අවන්හල් පිහිටා තිබුණි. සිය ගිම්හාන නිවාස මුලිනුපුටා ඇමිය හැකිතරම් ශක්තිමත් යෝධ යන්ත්‍රසූත්‍ර දෙස බලමින්, සංචාරකයෝ ප්‍රමෝදයෙන් යුතුව ඔබමොබ ඇවිද ගිය හ.

ඇන්ඩ්‍රියා ගේල් ද ග්ලෝව්සෙස්ටර් මැරීන් රේල්වේස් හි දී සුළු

UNEDITED SAMPLE PAGE

නඩත්තු කටයුතු වලට බඳුන් වී තිබුණ ද ඇගේ අලුත්වැඩියා කටයුතු මූලික වශයෙන් සිදු වූයේ වසර 1987 දී ෆ්ලොරිඩාවේ ශාන්ත ඔගස්ටීන් හි දී ය. ගැලුම් 1900ක ඉන්ධන ටැංකි දෙකක් සඳහා ඉඩ ලබාගනු පිණිස, ඇගේ අවර කොටස අමතර අඩි තුනකින් දීර්ඝ කරන ලදී. ඉදිරිපස වේල්බැක් තට්ටුවට තවත් අඩි නවයක වේදිකා කොටසක් එක් කෙරුණු අතර බෝට්ටු තට්ටුවේ වම්පස ආරක්ෂක යකඩ වැට උසින් වැඩි කොට අඩි දහඅටක් දක්වා දීර්ඝ කරන ලදී. එසේ නවීකරණය කරන ලද වේල් බැක් තට්ටුව මත අමතර ඉන්ධන බැරල් 28ක්, ජල බැරල් 7ක් සහ අයිස් නිපැයුම් යන්ත්‍රය ගබඩා කෙරිණි.

එසේ, වානේ, ඉන්ධන සහ යන්ත්‍ර සූත්‍ර ආදී වශයෙන්, සමස්ථයක් ලෙස මුලු බර ටොන් දහයක් පමණ ඇන්ඩ්‍රියා ගේල් හි ඉදිරිපස කොටසට එක් කරන්නට ඇත. බෝට්ටු තට්ටුවේ සිට අඩි අටක් පමණ ඉහළින් ද ජල මට්ටමේ සිට ඒ මෙන් දෙගුණයක් තරම් උසකින් ද පිහිටන සේ එසේ එකතු කරන ලද අමතර බර මඟින් ඇන්ඩ්‍රියා ගේල් හි ගුරුත්ව කේන්ද්‍රය ස්වල්ප වශයෙන් වෙනස් කරන ලදී. ඒ අනුව දැන් ඇයට වඩා වැඩි කිඳුමක් හිමිවනු ඇති අතර දෙපසට පැද්දීම වඩා මන්දගාමී ලෙස සිදුවනු ඇත.

අනෙක් අතට, මේ නිසා ඇයට වරෙකට සති හයක තරම් කාලයක් දියඹේ ගතකළ හැකි වනු ඇත. එ හෙයින් සියල්ල කෙළවර, අවසාන බලාපොරොත්තුව වූයේ එය බව කිවහොත් බෝට්ටුවේ කිසිවෙකු ඊට විරුද්ධ නොවනු ඇත.

UNEDITED SAMPLE PAGE